සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

| 11 ශ්‍රේණිය Grade 11 | පෙරදිග සංගීතය - I | පැය එකයි One hour |
|---|---|---|

නම/ විභාග අංකයඃ

සැ.යු. :- 
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසේ 01 සිට 40 දක්වා සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01 හින්දුස්ථානි සංගීතයේ භාවිතා වන මේල (ථාය) සංඛ්‍යාව
(1) 7 කි. (2) 8 කි. (3) 10 කි. (4) 12 කි.

02 විකෘති ස්වරයක් නොයෙදෙන්නේ,
(1) යමන් රාගයේ ය. (2) කාෆි රාගයේ ය. (3) භෛරවි රාගයේ ය. (4) භූපාලි රාගයේ ය.

03 කිසියම් රාගයක ගායන සමය රාත්‍රි දෙවන ප්‍රහරය වේ. ඒ අනුව එම රාගය ගැයීමට සුදුසු කාලය
(1) රාත්‍රි 9:00 - 12:00 දක්වා ය. (2) රාත්‍රි 3:00 - 6:00 දක්වා ය.
(3) රාත්‍රි 6:00 - 9:00 දක්වා ය. (4) රාත්‍රි 12:00 - 3:00 දක්වා ය.

04 රාගයක එකවර අත්නොහරින ස්වර වන්නේ,
(1) ෂඩ්ජය හා රිෂභය යි. (2) ෂඩ්ජය හා මධ්‍යමය යි.
(3) මධ්‍යමය හා පංචමය යි. (4) පංචමය හා ධෛවතය යි.

05 නිර්දේශිත රාග සම්බන්ධයෙන් වන වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) භෛරවි රාගයේ රි ග ම් ධ නි ස්වර විවාදීව යෙදේ
(2) භූපාලි රාගය කල්‍යාණ මේලගත සම්පූර්ණ ජාති රාගයකි
(3) යමන් රාගයේ ග නි වාදී සංවාදී වේ
(4) කාෆි රාගය රාත්‍රි දෙවන ප්‍රහරයේ ගැයේ

06 නි ධ - ප / ම්ප ග ම / ප්‍රම් ග්‍රම් ප්‍රධ නිස් / නිධ ප්‍රම් ග්‍රරි ස-
ඉහත ප්‍රස්ථාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ත්‍රිතාලයට වැයෙන යමන් රාගයේ මුකුඩාවක් සහ තානාලංකාරයකි.
(2) දීප්ජන්දි තාලයට වැයෙන යමන් රාගයේ ස්වර අභ්‍යාසයකි.
(3) ත්‍රිතාලයට වැයෙන භූපාලි රාගයේ මුකුඩාවක් සහ තානාලංකාරයකි.
(4) කාෆි රාගයේ තානාලංකාරයකි.

07 ධ ගෙ න ති / න ක ධි න මෙම තාල පදයෙහි 'ධ' සහ 'ධි' අක්ෂර හැරුණු විට අනෙකුත් අක්ෂර වැයීම සඳහා
(1) බායාව පමණක් භාවිතා කරයි. (2) දායාව පමණක් භාවිතා කරයි.
(3) දායාව සහ බායාව එකවර භාවිතා කරයි. (4) දායාව සහ බායාව වෙන වෙනම භාවිතා කරයි.

08 "බෝමළුව නිසසලය - සිසිලසින් සිත් පිනයි" මෙම ගී පාදයේ පද බෙදීම අනුව වාදනයට වඩාත් සුදුසු වන්නේ,
(1) ත්‍රිතාලය යි (2) කෙහෙර්වා තාලය යි (3) ජප් තාලය යි (4) දිප්ජන්දි තාලය යි

09 කෝඩ්ස් හා ගීතයේ තනුව එකවර වැයිය හැකි ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකි.
(1) මෙලෝඩිකාව (2) සර්පිනාව (3) එකෝඩියන් (4) සයිලෆෝනය

10 "FGAB♭ CDEF" මෙම ස්වර අයත් වන ස්කේලය (Scale) වනුයේ

(1) G major scale ය. (2) F♭major scale ය. (3) C major scale ය. (4) F major scale ය.

11 ජැක්සන් ඇන්තනි සහ අනුලා බුලත්සිංහල රංගනයේ යෙදුනු "නෛනගේ සුදුව....." ඇතුළත් නාට්‍යය වන්නේ,

(1) රතු හැට්ටකාරි (2) අබුද්දස්ස කෝළම (3) මධුර ජවනිකා (4) තාරාවෝ ඉගිලෙති

12 යමන් රාගය ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීතයක් නොවන්නේ,

(1) තිලකසිරි ප්‍රනාන්දු ගයන එන්න මදනලේ............

(2) ස්වර්ණලතා කවීශ්වර ගයන ස්වර්ණ ප්‍රදීපාය......

(3) සුජාතා අත්තනායක ගයන සාදු දන්ත දා.............

(4) දයාරත්න රණතුංග ගයන සැන්දෑ අහසේ............

13 කෝරල්, පැස්ටරෝල්, E♭major සිම්ෆනි නිර්මාණය කළ රොමැන්ටික් වාදී සංගීතඥයා වන්නේ,

(1) මෝසාර්ට් ය (2) හෙයඩින් ය (3) යානි ය (4) බීතෝවන් ය.

- **අංක 14 සිට 18 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත බෙරපද අදාළ කර ගන්න.**

A - ජෙංත තකට / ජෙංත තකට

B - ගත් - - / ත - ග - / දි ත - / ගු - ගු - / දං - -

C - දො ම් කි ත / කි ත දො ම්

D - රත් තුං කිට / දිත් තුං - /

14 ඉහත A, B, C බෙරපද අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) උඩරට, පහතරට, සබරගමු (2) සබරගමු, පහතරට, උඩරට

(3) පහතරට, සබරගමු, උඩරට (4) සබරගමු, උඩරට, පහතරට

15 තාලයක් හා වෘත්තයක් පදනම් කරගනිමින් නම් කර ඇති වන්නමක් සඳහා වාදනයට සුදුසු බෙර පදය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

16 D අක්ෂරයට හිමි තාල පදය වාදනය කිරීමට සුදුසු වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) දවුල (2) තම්මැට්ටම (3) මද්දලය (4) ගැටබෙරය

17 ඉහත A බෙරපදය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) A බෙර පදය කෝකිල වන්නම සඳහා භාවිතා කරයි

(2) A බෙරපදය වාදනය වන්නේ දවුලෙනි

(3) A බෙරපදය අයත් සම්ප්‍රදායේ ඉරට්ටිය නටනු ලැබේ.

(4) A සම්ප්‍රදායට අයත් වන්නම් සංඛ්‍යාව නාමිකව 24 කි.

18 පිළිවෙලින් A B C බෙර පද සඳහා වඩාත් ගැළපෙන හින්දුස්ථානි තාල වන්නේ,

(1) ජප්, දීප්ජන්දි, ත්‍රිතාල් ය. (2) ලාවනී, ජප්, ත්‍රිතාල් ය.

(3) බෙම්පියෝ, දීප්ජන්දි, කෙහෙර්වා ය. (4) ජප්, දීප්ජන්දි, කෙහෙර්වා ය.

19 රන්මුතුදූව, ගැටවරයෝ චිත්‍රපට වල සංගීත අධ්‍යක්ෂවරයා

(1) ආර්. මුත්තුසාමි මහතාය (2) බී. එස්. පෙරේරා මහතාය

(3) මොහොමඩ් ගවුස් මහතාය (4) ඩබ්. ඩී. අමරදේව මහතාය

20 රේඛාව චිත්‍රපටයේ ගීත දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රණ ගිරා......, රජින මමයි, සුදට සුදේ..... (2) ගලන ගඟකි, පිපී පිපී රේණු....., පාරමිතා බල

(3) ජීවන මේ ගමන, ඉදිරියටා යමු, පෙම් කැකුළ (4) සුදු සඳ එළියේ, ඕළු නෙළුම්, වෙසක් කැකුළු

21 මව්පියො ආදී......... හරිම් රජ සැපා.........., සිරිබුද්ධගයා යන ගී නම් කළ හැකි වන්නේ,

(1) නූර්ති ගී වශයෙනි (2) චිත්‍රපට ගී වශයෙනි

(3) ග්‍රැමෆෝන් ගී වශයෙනි (4) කණ්ඩායම් ගී වශයෙනි

22 ගැල්, පැල්, පතල්, පාරු ගී සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) අනායාසාත්මකය. (2) මෙහෙ ගී වේ.

(3) ඒකලව ගායනා කරයි. (4) සමූහ ගායනයට සුදුසුය.

23 'ස' ස්වරයේ සංඛ්‍යාතය 256 කි. 'ස' සහ 'ප' අතර සංඛ්‍යාත අනුපාතය 2 : 3 ඒ කි. එසේ නම් 'ප' ස්වරයේ සංඛ්‍යාතය වන්නේ,

(1) 340 යි (2) 384 යි (3) 388 යි (4) 426 යි

24 සමුද්‍රඝෝෂ විරිතට අනුව ගැයෙන ගී පාදය තෝරන්න.

(1) රූ රැසේ අඳිනා ලෙසේ...... (2) රළලා උපුලා ලෙළුම තුලායා...

(3) පැහැසරණිය මිණි පැමිණිය...... (4) මන්මත් කරවන දන මුළු දෙරණා.....

25 මෝසාර්ට් නම් බටහිර සංගීතඥයාගේ සිම්ෆනියක් නොවන්නේ මින් කුමක් ද?

(1) ජුපිටර් (2) NO 40 (3) NO 39 (4) කොරල්

- **පහත රූප සටහනේ දැක්වෙන්නේ ඉන්දීය සංගීතඥයන් සිව් දෙනෙකි. ඒ ඇසුරින් 26 සිට 29 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



A B C D

26 ඉහත A, B, C සංගීතඥයන් අතැති වාද්‍ය භාණ්ඩ, සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව පිළිවෙලින්

(1) සුෂිර, අවනද්ධ, තත් ගණයට අයත් ය. (2) තත්, අවනද්ධ, සුෂිර ගණයට අයත් ය

(3) සුෂිර, ඝණ තත්, ගණයට අයත් ය. (4) ඝණ, සුෂිර, අවනද්ධ ගණයට අයත්ය

27 වාදනයේ දී කායදා, පල්ටා, ගත්, පරන්, තිහායි ආදී ශිල්ප ක්‍රම භාවිතා කරන සංගීතඥයා දැක්වෙන රූප සටහන වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

28 "රෝජා" චිත්‍රපටය සඳහා සංගීතය නිර්මාණය කළ ශිල්පියා වන්නේ,

(1) A - හරි ප්‍රසාද් චෞරසියා (2) B - ශකීර් හුසේන්

(3) C - රවි ශංකර් (4) D - AR රහුමාන්

29 සත්‍යජිත් රායිගේ චිත්‍රපට සඳහා සංගීත නිර්මාණය කළ ලෝකප්‍රකට ශිල්පියා දැක්වෙන රූප සටහන වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

30 "නොමදින් විකුම් පාලා......" යන ගී පාදය,

(1) ප්‍රශස්තිය කි. (2) ගැමි ගීයකි. (3) හටන් කවියකි. (4) වන්නමකි.

31 + නිරිත / කො ණ යු / තා s මල්

මෙම ගී පාදය ආරම්භ වන්නේ,

(1) සමග්‍රහයෙනි. (2) බලියෙනි. (3) අවග්‍රහයෙනි. (4) විෂම ග්‍රහයෙනි.

- **අංක 32 - 34 දක්වා පිළිතුරු සැපයීමට පහත ගී පාදය අදාළ කර ගන්න.**

''දෑතට වළළු මල් මුතු වැල් මාලා පොටයි''

32 ඉහත ගී පාදයේ සඳැස්මත් හා ගී මත් ගණන පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 16, 32 (2) 18, 24 (3) 19, 24 (4) 24, 24

33 ඉහත ගී පාදය නිර්මාණයට පදනම් වූ ජන ගීතය වන්නේ,

(1) පැල් කවි (2) නෙළුම් කවි (3) ශාන්ති කර්ම ගී (4) කමත් කවි

34 ජන ගී ඇසුරින් ඉහත ගීතය නිර්මාණය කරන ලද්දේ,

(1) රෝහණ බැද්දගේ මහතාය (2) රෝහණ වීරසිංහ මහතාය

(3) ලයනල් රංවල මහතාය (4) සී. ද එස්. කුලතිලක මහතාය

35 දයානන්ද ගුණවර්ධනයන්ගේ ජස ලෙංචිනා, ගජමන් පුවත, ආනන්ද ජවනිකා, මධුර ජවනිකා නාට්‍ය සඳහා සංගීතය නිර්මාණය කරනු ලැබුවේ,

(1) සී ද එස් කුලතිලක මහතා විසිනි. (2) රෝහණ බැද්දගේ මහතා විසිනි.

(3) W B මකුලොළුව මහතා විසිනි. (4) ලයනල් රන්වල මහතා විසිනි.

36 වංග සංගීතය ඇසුරින් නිර්මාණය කරන ලද සරල ගීතයකි.

(1) ආදරයේ උල්පත වූ අම්මා (2) බැස සිතල ගඟුලේ

(3) මාරම්බරී...... කෝළ වී (4) ගුමු ගුමුව වදුලේ.......

37 සංගීත භාණ්ඩයක නාද උත්පාදකයේ දිග ඝනකම වෙනස් වන විට ඉන් නිකුත් වන නාදයේ ඇති වන වෙනස

(1) තාරතාවය යි. (2) විපුලතාවය යි. (3) රූප භේදය යි. (4) ධ්වනි ගුණය යි.

38 

මෙම රූප සටහනේ දැක්වෙන්නේ

(1) Bass clef (2) Tie notes (3) Key signature (4) Minim

39 ශබ්දය ගබඩා කළ මුල්ම තාක්ෂණික මෙවලම වන්නේ

(1) ග්‍රැමෆෝන තැටිය යි. (2) C D තැටිය යි. (3) කැසට් පටය යි. (4) DVD තැටිය යි.

40 එක් එක් භාණ්ඩයෙන් නිකුත් වන සංගීතය වෙන් වශයෙන් පටිගතකිරීම හඳුන්වනු ලබන්නේ,

(1) Sound font ලෙසය (2) Multi - Track Recording ලෙසය

(3) Midi Music ලෙසය (4) Key Board Music ලෙසය

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

| 11 ශ්‍රේණිය<br>Grade 11 | පෙරදිග සංගීතය - II | පැය දෙකයි<br>Two hour |
|---|---|---|

උපදෙස් :
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

---

- අංක i සිට iv තෙක් අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

01 (i) කාෆි රාගය හා භෛරවී රාගය අතර දැකිය හැකි සමාන ලක්ෂණයක් ලියන්න.
(ii) භූපාලි රාගයේ යෙදෙන ස්වර සංගතියක් ලියන්න
(iii) අනුතාල ස්ථාන නොයෙදෙන තාලයක යේකාව ලියන්න
(iv) $D^m$ chord සඳහා අදාළ වන ස්වර නම් කරන්න.

- අංක (v) - (viii) තෙක් අසා ඇති ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර ලියන්න.

(v) හෙළ ගී මග ග්‍රන්ථයේ කතුවරයා .................................................................................. මහතාය.
(vi) පද්මාවති තූර්තිය ............................................................ මහතා විසින් නිෂ්පාදනය කරන ලදී.
(vii) තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ සංගීත නිර්මාණය ................................................................... මහතා විසින් සිදුකර ඇත.
(viii) Acropolis, Tribute වැනි නිර්මාණ ............................................................... නම් ඉතාලි ජාතික සංගීතඥයා විසින් සිදුකර ඇත.

- අංක ix, x සඳහා වරහන් තුළින් තෝරාගත් පිළිතුරු ඇසුරෙන් හිස්තැන් පුරවන්න.
(මුදුප්පදය, උතුරු ඉන්දියානු, භජන්, දකුණු ඉන්දියානු)

(ix) ප්‍රශස්ති ............................................. සංගීත ආභාෂය ලැබූ ............................... සහිත ගීත විශේෂයකි.
(x) දෙවියන් වෙනුවෙන් මීරාබායි, තුල්සිදාස් ආදීන් රචනා කළ .......................................... ගී ................................ සංගීතයේ ප්‍රචලිත සරල ශාස්ත්‍රීය ගායනා විශේෂයකි.

02 නිර්දේශිත රාග දෙකක් සම්බන්ධ තොරතුරු a හා b යටතේ දක්වා ඇත.
a) රාගයක තිබිය යුතු අවම ස්වර සංඛ්‍යාව සංකලනයෙන් නිර්මාණය වූ රාගයකි.
b) ස්වර සප්තකයේ යෙදෙන සියළු විකෘති ස්වර, මෙම රාගයේ භාවිතා වන අතර, සම්පූර්ණ ජාති රාගයකි..
(i) a හා b මඟින් ප්‍රකාශ වන රාග දෙක නම් කරන්න.
(ii) b රාගයට අයත් ලක්ෂණ ගීතයක මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි හා අන්තරා තාල සහ සංකේත සහිතව ගිත ස්වර ප්‍රස්තාර කරන්න.
(iii) එක් රාගයකට අදාළ මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න.

03 නිර්දේශිත රාග දෙකකට අදාළ ස්වර සංගති කිහිපයක් පහත දැක්වේ.

| ගරිගප - ධනිස් | ත්‍රිරිගරිස - - | ස් - ධපමගමරි |
|---|---|---|
| පම්ගරිනිරි - - ස | පරි - - ගරිස | ගපමගමරි |

(i) ඉහත සංගති හඳුනාගනිමින් අදාල රාග දෙක යටතේ වෙන් කරන්න.

(ii) එම රාග අතරින් උදය කාලයේ ගායනයට උචිත රාගයේ ආරෝහණ, අවරෝහණ වාදි සංවාදි ස්වර ලියන්න

(iii) ii හි ලියූ තොරතුරු ප්‍රකාශ වන රාගයට අයත් සර්ගම් ගීතය ප්‍රස්තාර කරන්න.

(iv) iii හි ප්‍රස්තාරයට අදාල තාලය නියමිත කාල සංකේත යොදා ප්‍රස්තාර කරන්න.

04 පහත දැක්වෙන්නේ දේශීය වාද්‍ය භාණ්ඩ ලැයිස්තුවකි.

- ගැටබෙරය
- යක්බෙරය
- උඩැක්කිය
- හොරණෑව
- දවුල
- තම්මැට්ටම
- ගෙජ්ජි

(i) මෙම භාණ්ඩ දේශීය භාණ්ඩ වර්ගීකරණය අනුව වර්ග කරන්න.

(ii) දෙතිතට අයත් බෙර පදයක් නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න.

(iii) ඉහත (ii) හි ප්‍රස්ථාර කරන ලද තාලය මත ගායනය කළ හැකි ගැමි ගීයක් හා සේ ගීයක පළමු පේළිය ලියන්න.

(iv) ගැමි ගී හා සේ ගී අතර ඇති විශේෂතා කරුණු 02 බැගින් ගෙන සංසන්දනය කරන්න.

05 පහත දැක්වෙන ප්‍රකාශයන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A - රකිනු ඊශ්වරා, අප ගුණ සරු සිංහල භූපති යනාදී ගීත අයත් වේ.

B - සිංහබාහු, මනමේ නාට්‍ය නිර්මාණය සඳහා ආභාසය ලබා ඇත.

C - ජසයා, ලෙංචිනා, අණබෙර ආදී චරිත ඇත.

D - සශ්‍රිකත්වය අරමුණු කර ගනිමින් රඟ දක්වයි.

(i) ඉහත A, B, C, D නාට්‍ය හඳුනාගෙන නම් කරන්න.

(ii) B නාට්‍ය සඳහා උත්තර භාරතිය සංගීත ආභාසය ලැබී තිබේ. ඒ බව තහවුරු කිරීම සඳහා කරුණු 02 ක් ඉදිරිපත් කරන්න.

(iii) B නාට්‍ය ශෛලිය සඳහා යොදාගත් සංගීත භාණ්ඩ, තාල, ගීතයන් හි සුවිශේෂි අංග, සංගීතඥයන් ඇතුළත් වනසේ කෙටි සටහනක් ගොඩ නගන්න.

(iv) C හා D නාට්‍ය ශෛලීන්ට අදාළ ගීත දෙකක් මුල් පේළි දෙක පද ප්‍රස්ථාර කරන්න.

06 පහත දැක්වෙන්නේ පෙරදිග ස්වර ප්‍රස්තාරයක කොටසකි.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | මග | රි | ග | ස | - | - | රි | ග | - | - | - | - | ග | ම | න |
| රි | ස | නි̣ | ධ̣ | නි̣ | - | රි | - | ස | - | - | - | + | + | ම | ග |

(i) ඉහත ස්වර ප්‍රස්ථාරය මධ්‍යම භාවයට පෙරළා නැවත ලියන්න.

(ii) මධ්‍යම භාවයට පෙරළන ලද ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට අනුව ප්‍රස්ථාර කර දක්වන්න.

(iii) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය දක්වා එක් එක් වර්ගයට උදාහරණ 02 බැගින් ලියන්න.

07 පහත ශීර්ෂ අතරින් 04 ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මුල් යුගයේ ගුවන් විදුලි ගී නිර්මාණකරුවෝ

(ii) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය

(iii) සරල ගීතයක ආකෘතිය

(iv) ප්‍රසංග වේදිකාව හා තාක්ෂණික මෙවලම්

(v) ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය ආරම්භය හා විශේෂ ලක්ෂණ

(vi) කපිරිඤ්ඤා ගී